# සන්නස

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0439 925 241

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


**අපේ ලිපිනය**
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380


## සංස්කාරක සටහන

සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. සන්සේ පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි සිංහල, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.



# ශ්‍රී.ල.නි.ප. එ.ජා.ප. ගිවිසුම

## කොතෙක් දුර යා හැකිද?

**ශ්‍රී ලාල් ප්‍රියන්ත**

ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය හා එක්සත් ජාතික පක්‍ෂය පසුගිය ඔක්තෝබර් මස 23 වැනිදා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර මෙතෙක් කලක් දෙපාර්ශවයක් වශයෙන් ක්‍රියා කළ එම දෙපිල එකම පාර්ශවයක් ලෙස කටයුතු කිරීමට ගිවිස ගත්හ.
එම ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව දෙපාර්ශවයේම නායකයෝ සහ ඔවුන්ගේ හිතෛෂීන් ප්‍රකාශ කළේ මෙය ඓතිහාසික ගිවිසුමක් බවය. මෙතෙක් කලක් ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ කිසිවෙකුටත් කිරීමට නොහැකි වූ කර්තව්‍යයකට මහින්ද රාජපක්‍ෂ හා රනිල් වික්‍රමසිංහ මුල පුරා ඇති බව ඔවුන් ඉන් තවදුරටත් ප්‍රකාශ කර සිටියහ.
නමුත් අප දන්නා ඉතිහාසය තුළ විවිධ දේශපාලන පක්‍ෂ ඓතිහාසික යැයි කියා ප්‍රකාශ කර අත්සන් කරන ලද ගිවිසුම් වැඩිකල් තිබුණේ නැත. ඒවා ඉතා කෙටි කාලයකින් විවිධ ප්‍රශ්න මතුවී එකිනෙකාට එරෙහිව අවසානයේ චෝදනා එල්ල කර ගනිමින් නිමාවට පත්විය.

ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්‍ෂය, සම සමාජ පක්‍ෂය යනාදි පක්‍ෂ ඒකරාශී වී 1970 දී ඇති කරන ලද සමගි පෙරමුණ ආණ්ඩුව, හත් හවුල් ආණ්ඩුව, සභාග ආණ්ඩු, පොදුජන එක්සත් පෙරමුණ හා ජනතා විමුක්ති පෙරමුණ එකතු වී ගොඩනැගූ පරිවාස ආණ්ඩු, ශ්‍රී ල.නි.ප. ය හා ජ.වි.පෙ. ඇති කළ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩු යනාදී පිරිස් එකතු වී අත්සන් කළ ගිවිසුම් වලට අවසානයේ සිදුවූයේ කුමක්ද?
ඉතාමත් දැහැමි සිතින් යුතුව එම දෙපාර්ශ්වයන් ඒකරාශී වුවත්, වැඩිකල් යෑමට මත්තෙන් ඔවුන් වෙන්ව ගියේ කඩු කිණිසි අතට ගෙන එකිනෙකා මරා ගන්නා තත්ත්වයට පත් කරවමිනි.
ඊට මෑත ඉතිහාසය තුළ ලැබුණු හොඳම උදාහරණය මහින්ද රාජපක්‍ෂ මහතා සහ ජ.වි.පෙ. අතර ඇති කරගත් ගිවිසුමය. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය සමඟ ගිවිසුම් අත්සන් කර අමාරුවේ වැටී සිටි ජ.වි.පෙ. ඊළඟට පිවිසුණේ මහින්ද රාජපක්‍ෂ මහතා වෙතය.



සියලුම ආගම් ශාස්තෘවරුන්ගේ සෙත් පිරිත් සජ්ජායනා මධ්‍යයේ සහ බුද්ධිමතුන් යැයි කියන ආචාර්ය, මහාචාර්යවරුන්ගේ සුභ පැතුම් මැද මහින්ද රාජපක්‍ෂ හා ජ.වි.පෙ. විවාහ ගිවිස ගත්තද එම කසාදය පැවැතුණේ ඉතාම කෙටි කාලයකි. එම දෙපාර්ශවය එකතුවීමෙන් අනතුරුව බොහෝදෙනා ප්‍රකාශ කළේ මෙය කිසිදා කිසිවෙකුටත් බිඳිය නොහැකි ඓතිහාසික ගිවිසුමක් බවය. දෙපාර්ශවයේ එකතුවීම හරහා රට කිසිදා නොසිතූ ආකාරයට දියුණු කිරීමට අවස්ථාව උදාවන බව ප්‍රකාශ වුණේ ජනතාවගේ සිත් සතන් තුළ නව යුගයක අරුණළු උදා කරවමිනි.
නමුත් අද සිදුවී ඇත්තේ කුමක්ද? මහින්ද රාජපක්‍ෂ එක් පැත්තකය. ජ.වි.පෙ. තව පැත්තකය. කව්රුත් බලාපොරොත්තු නොවූ එ.ජා.ප.ය මහින්ද රාජපක්‍ෂ ළඟය. එම කසාදයත් කොතෙක් කලක් තිබේද? යන්න සැක සහිතය. අතීත ගිවිසුම් දෙස විමර්ශණාත්මකව බැලීමේදී අප කාටත් එම ප්‍රශ්නය සිත තුළ නිතැතින්ම පැළ පදියම්වීම ස්වාභාවිකය.
අප දන්නා ආකාරයට ශ්‍රී ලංකාවේ ඓතිහාසික යැයි ප්‍රකාශ කර අත්සන් කරන ලද ගිවිසුම් සැබැවින්ම ඓතිහාසිකය. මන්ද, ඉතිහාසයේ සිටම අත්සන් කරන ලද කිසිම ගිවිසුමක් වැඩිකල් තිබුණේ නැත. ඒ අතින් බලන කළ ඒවා සැබැවින්ම ඓතිහාසිකය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඒවා ඓතිහාසිකය. මන්ද, ඒවා වැඩිකල් නොපවතින බැවිනි.
ඒ අතින් බලන කළ ශ්‍රී.ල.නි.ප. ය හා එ.ජා.ප. ය අතර අත්සන් කළ ගිවිසුමටත් වැඩිකල් යෑමට ඇති අවස්ථා ඉතාම විරලය. එය දෙපාර්ශ්වය ගිවිසුම් අත්සන් කළ පසුගිය ඔක්තෝබර් මස 23 වැනිදායින්ම මනාව පැහැදිලි විය.



එම අවස්ථාව එ.ජා.ප.යේ ප්‍රබල දේශපාලන චරිතයක් වන රාජිත සේනාරත්න, මහින්ද විජේසේකර, එස්.බී. දිසානායක වැනි රනිල් වික්‍රමසිංහ විරෝධී අය වර්ජනය කර තිබිණි. අනෙක් පැත්තෙන් ආණ්ඩු පක්‍ෂයේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමැතිවරයා ඇතුළු කිහිපදෙනෙක් වර්ජනයට ඒකරාශී වී සිටියේය.
එ.ජා.ප.යේ නායක රනිල් වික්‍රමසිංහ මහතාව පක්‍ෂ නායකත්වයෙන් ඉවත් කිරීමේ සටනේ ප්‍රබල චරිතයක් වන මහින්ද විජේසේකර මහතා ගිවිසුම් අත්සන් කරන දින ලංකාවේවත් සිටියේ නැත. ඔහු ඊට පෙර දිනම ඉන්දියාව බලා ගියේ ගිවිසුම් අත්සන් කරන දින ලංකාවේවත් සිටීම එතරම් උචිත නැති බව නිසා විය හැක. නමුත් රාජිත සේනාරත්න, එස්.බී. දිසානායක යන මහත්වරුන් ලංකාවේ සිටියහ. එහෙත් ඔවුන් ඊට සහභාගි නොවීම බොහෝදෙනාගේ දැඩි කතා බහට ලක්විය. එස්.බී. දිසානායක සිය මිතුරන්ට ප්‍රකාශ කර තිබුණේ එම අවස්ථාවට සහභාගිවීමට තමන්ට කිසිදු ආරාධනාවක් නොලැබුණු බවය.

එස්.බී. දිසානායක යනු එ.ජා.ප.යේ ජාතික සංවිධායක ලේකම්වරයාය. ඔහු පක්‍ෂයේ වැදගත් මුල් පෙළේ දේශපාලන චරිතයකි. ඔහුට ගිවිසුම් අත්සන් කරන අවස්ථාවට සහභාගි වන ලෙස ආණ්ඩු පක්‍ෂයෙන් හෝ එ.ජා.පයෙන් ආරාධනාවක් නොකිරීම හරහා පෙන්නුම් කර ඇත්තේ ඔහුව නොසළකා හැරීමකි. ආණ්ඩු පක්‍ෂයෙන් ඔහුට ආරාධනාවක් නොතිබුණත්, ජාතික සංවිධායක ලේකම්වරයා වශයෙන් ඔහුව එම අවස්ථාවට සහභාගි කර ගැනීම එ.ජා.ප.යේ යුතුකමක් සහ වගකීමක් තිබිණි.

නමුත් එය මඟ හැරීමෙන් පෙන්නුම් කරන්නේ එ.ජා.ප.යේ තිබෙන ගැටුම්කාරී තත්ත්වයයි. ප්‍රධාන දේශපාලන පක්‍ෂ දෙක එකතු වී රට ගොඩනැගීමට යැයි ප්‍රකාශ කර ගිවිසුම් ගැසුවත් පක්‍ෂය තුළ ඇත්තේ මිනීමරා ගන්නා ස්වරූපයකි.
එකිනෙකාට එකෙක් නැත. ඉන්න අයත් කැත්තට පොල්ල මෙන්ය. රට ගොඩ නැගීමට ගිවිසුම් ගසා එකතු වන්නේ මේ අයද? යන ප්‍රශ්නය මතුවන්නේ මෙවිටය. එ.ජා.ප.ය තුළ පූර්ණ ප්‍රතිසංවිධානයක් අවශ්‍ය බවට ප්‍රකාශ කරමින් ඒ සඳහා අරගල කරන රාජිත සේනාරත්න මහතා නම්, ගිවිසුම් අත්සන් කරන දින ලංකාවේ සිටියත්, ඔහු එම අවස්ථාවට සහභාගි වුණේ නැත. දෙපාර්ශ්වය එකතු වී ගිවිසුම් ගැසුවා නම්, මැති ඇමැති